# සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය. (බස්නාහිර පළාත ඇසුරින්)

කේ. දිනිති ප්‍රදීපා මධුෂානි[1]

## 1. හැඳින්වීම

අන්තර්ජාල තාක්ෂණය සොයා ගැනීමත් සමඟ මානව සන්නිවේදනය වේගවත් වූ අතර වර්තමානය වනවිට ලෝකයේ මෙන්ම ලංකාවේද ඒ හරහා අපරාධවලට යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇත (ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය, 2020). එනම් අනවසරයෙන් ඇතුල් වීම, මාර්ගගත තර්ජනය, ලුහුබැඳීම හා ව්‍යාජ සැබැඳි මිත්‍රත්වය එසේ බහුලව සමාජ මාධ්‍ය හරහා සිදු වූ අපරාධ වර්ග ලෙස හඳුනාගත හැකි විය. ලංකාවේ 2019ට සාපේක්ෂව 2020 වර්ෂයේ 16376කට අධික අපරාධ ප්‍රමාණයක් සමාජ මාධ්‍ය හරහා සිදු වී ඇත (ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය, 2020).

Carter, (2013) විසින් සිදුකර ඇති අධ්‍යයනයට අනුව උපාධි අපේක්ෂකයන් සඳහන් කර ඇත්තේ වෙනස් සහ නිතර මුරපද වෙනස් කිරීම, ශක්තිමත් අනන්‍යතාවයක් සමාජ මාධ්‍ය හරහා ගොඩනගා ගැනීමට දැනුවත්භාවයක් පැවතීම වැදගත් බව පෙන්වා දී ඇත. තවද Keipit,et al., (2017) සිදුකර ඇති අධ්‍යයනය තුළින් අන්තර්ජාල හිංසනය පිළිබඳ විශ්ලේෂණය කරන අතර එයට ප්‍රධාන හේතුවක් ලෙස පෞද්ගලික අමනාපකම් පෙන්වා දී ඇත. Gatti සහ Napoli, (2019) විසින් සිදුකර ඇති අධ්‍යයනයේදී දෙමාවුපියන්ගේ සංජානනය සහ දරුවන්ගේ සමාජ මාධ්‍ය භාවිතය පවුල් සබඳතාවලට හානියක් නොවන පරිදි කලමනාකරණය කළ හැකි බව පෙන්වා දී ඇත.

මේ අනුව පැහැදිලි වන්නේ දේශීය හා විදේශීය වශයෙන් සමාජ මාධ්‍ය ආශ්‍රිතව පරිශීලකයන් මුහුණ දෙන හිරිහැර පිළිබඳවත් ඒ සඳහා බලපාන කරුණු පිළිබඳවත් අධ්‍යයනය කර ඇති බව ය. නමුත් මොවුන් සමාජයේ එක් ජන කොට්ඨාසයක් හෝ ෆේස්බුක් වැනි එක් සමාජ ජාලා වර්ගයක් තුළ සිදුවන අපරාධ පිළිබඳව පමණක් අනාවරණය කර ඇති නමුත් සමාජ මාධ්‍ය ආශ්‍රිතව සිදුවන අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක පිළිළිබඳ අධ්‍යයන සිදු කර ඇත්තේ ඉතා සුළු වශයෙනි. එමනිසා සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක යන මාතෘකාව කාලීන මෙන්ම සමාජයීය වශයෙන් වැදගත් ය.

එසේම මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ සමාජ මාධ්‍ය පරිශීලකයන් පදනම් කරගෙන සිදුකරනු ලබන අතර එම නිසා මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල සාමාන්‍යකරණය කිරීමේ හැකියාව සීමා වෙයි. තවද වර්තමානය වනවිට සමාජය තුළ අපරාධ රැසක් හඳුනාගත හැකි අතර මෙම

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
dinithipradeepa@gmail.com

අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය හරහා සිදුවන අපරාධ පිළිබඳපමණක් සීමා වී අධ්‍යයනය කිරීම සිදු කරනු ලබයි. එසේම දත්ත රැස් කිරීමේදී භාවිත කරන ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමයක් වන ප්‍රශ්නාවලි ක්‍රමය පමණක් භාවිත කිරීම හා එය සිංහල මාධ්‍යයෙන් පමණක් ලබාදීම සිදුකරන නිසා භාෂා සාක්ෂරතාවය පවතින ජනගහනය පමණක් අධ්‍යයනය සඳහා යොදා ගැනීමටද සිදුවේ. මේ ආකාරයට අධ්‍යයන සීමා කිහිපයක් මෙහිදී හඳුනාගත හැක.

**2. අධ්‍යයන අරමුණ**

සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය කිරීම.

**3. අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් බස්නාහිර පළාත තෝරා ගනු ලැබීය. ඒ අනුව යමානි ක්‍රමවේදය යටතේ නියැදි ඒකක 100ක් තෝරාගෙන ඇත. එනම් ස්තෘත සසම්භාවී නියදුම් ක්‍රමය යටතේ පවතින සමානුපාතික විභේදනය යටතේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කය යන දිස්ත්‍රික්කවලට අයත් අපරාධ ගොදුරු බවට පත්වූ පුද්ගලයින් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් අපරාධ ගොදුරු වු පුද්ගලයින් 40ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයෙන් අපරාධ ගොදුරු වූ පුද්ගලයින් 39ක් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් අපරාධ ගොදුරු වූ පුද්ගලයින් 21ක් ද වශයෙන් සමස්ත නියැදිය තෝරා ගන්නා ලදී.

**4. දත්ත විශ්ලේෂණය**


සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක විශ්ලේෂණය සිදුකිරීම අධ්‍යයන විශ්ලේෂණය හරහා සිදුකරනු ලැබූ අතර මෙහිදී සමාජ මාධ්‍ය හරහා අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන විචල්‍යයන් 15ක් හඳුනාගත හැකිවිය. එනම් මෙම සාධක මත පදනම්ව Principal Component Factoring (PCF) යන සාධක නිස්සාරණ ක්‍රමවේදය (Factoring Extraction) යටතේ Varimax යන සාධක කැරකැවීමේ ක්‍රමය (Rotating Factors) අනුව අධ්‍යයන විශ්ලේෂණය සිදුකර ඇත. මෙම අධ්‍යයනයට අනුව පෙනීයන්නේ අයිගන් අගය 1ට වඩා වැඩි සංරචක 3ක් පමණක් ඇති බවයි. අයිගන් අගය 1ට වැඩි වීම මත පදනම්ව එම සංරචක තුන ප්‍රධාන සාධක ලෙස ලබා ගන්නා අතර එමගින් සලකා බලන විචල්‍යයන් 15හි විචලනයෙන් 74%ක් විස්තර වන බව දැක්විය හැකිය. එනම් මෙහි දී සලකා බලන විචල්‍යයන් 15හි විචලනයෙන් 31.5%ක් පළමු සංරචකය මගින්, 24.6%ක් දෙවන සංරචකය මගින් සහ 18.2%ක් තුන්වන සංරචකය මගින් ආදී වශයෙන් විස්තර වේ.

වගු අංක 1: PCF - Varimax ක්‍රමය අනුව සංරචක නිර්මාණය කිරීම

| | සංරචක | | |
|---|---|---|---|
| | **1** | **2** | **3** |
| ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම | 0.258 | 0.039 | **0.889** |
| සමාජ මාධ්‍ය වෙත පිවිසීමට යොදා ගන්නා උපාංගයෙහි ඔබගේ ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම | 0.339 | 0.287 | **0.763** |
| සමස්ත සමාජ මාධ්‍ය පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම | **0.768** | 0.260 | 0.282 |
| සමාජ මාධ්‍ය හරහා පැමිණෙන ලින්ක් විවෘත කිරීම | 0.349 | **0.674** | 0.080 |
| තෑගි ලබා දෙනවා යැයි පවසන සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම | 0.306 | **0.839** | -0.004 |
| සමාජ මාධ්‍ය හරහා සිදුවන අපරාධ පිළිබඳ දැනුවත්භාවයක් නොපැවතීම | 0.182 | **0.825** | 0.245 |
| පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම | 0.251 | **0.716** | 0.455 |
| සමාජ මාධ්‍ය භාවිතයත් සමග පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම | **0.709** | 0.307 | 0.241 |
| සමාජ මාධ්‍ය හරහා වැඩි කාලයක් ගත කිරීම | **0.827** | 0.171 | 0.133 |
| පෞද්ගලික අමනාපකම් | **0.628** | 0.452 | 0.297 |
| මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම | **0.834** | 0.179 | 0.233 |
| අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම | **0.711** | 0.270 | 0.426 |
| සමාජ මාධ්‍ය හරහා නිවැරදිව අනන්‍යතාවය නොදැක්වීම | **0.516** | 0.475 | 0.471 |
| ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම | 0.251 | **0.611** | 0.594 |
| සමාජ මාධ්‍ය හරහා ව්‍යාපාරික කටයුතුවල නිරත වීම | **0.739** | 0.403 | 0.168 |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

වගු අංක 01හි Varimax සාධක කැරකීමේ ක්‍රමය අනුව ප්‍රධාන සංරචක තුනට අදාළ විචල්‍යයන්ගේ බෙදා වෙන් වූ ආකාරය පහත දැක්වේ. ඒ අනුව පළමු සංරචකයට විචල්‍යයන් 8ක් ද දෙවන සංරචකයට විචල්‍යයන් 5ක් ද තුන්වන සංරචකයට විචල්‍යයන් 2ක් වශයෙන් ද බෙදී ගොස් ඇත.




රූප සටහන 1: PCF- Varimax ක්‍රමය යටතේ සාධක විශ්ලේෂණයට අනුව සමාජ මාධ්‍ය හරහා අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

**5. නිගමන සහ යෝජනා**

ඒ අනුව ප්‍රධාන අරමුණ වූ සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීම සඳහා Principal Component Factoring Varimax ක්‍රමය යටතේ සාධක විශ්ලේෂණය තුළින් සමාජ අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන විචල්‍යයන් සමාජ බලපෑම, ආර්ථික බලපෑම සහ පරිශීලක හැසිරීමේ බලපෑම යන ප්‍රධාන සංරචක තුනක් යටතේ හඳුනාගත හැකිය. එසේම අධ්‍යයනයට අනුව යෝජනා කීපයක් හඳුනාගත හැකිය. එනම්, පරිශීලකයින් තම සමාජ මාධ්‍ය ගිණුම තුළ අසාමාන්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ඇඟවීම් සක්‍රීය කිරීම කළ යුතුය. සමාජ මාධ්‍ය ගිණුම් තුළට තමන් නොදන්නා පුද්ගලයින් එකතු කර ගැනීමෙන් වැළකිය යුතු අතරම

යමෙකු එකතු කර ගැනීමට පෙර ඔහුගේ මිතුරන් ලැයිස්තුවෙහි සිටින පුද්ගලයින් සහ ඔහුගේ පෙර සමාජ මාධ්‍ය තුළ ක්‍රියාකාරකම් පිළිබඳ පරීක්ෂා කර බැලිය යුතු බව යෝජනා කරමි, කිසිදු විටක සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරන දැන්වීම්වලට සිය පෞද්ගලික තොරතුරු මෙන්ම බැංකු කාඩ්වල තොරතුරු ලබා නොදීම කළ යුතුය, සමාජ මාධ්‍ය හරහා පැමිණෙන ලින්ක් විවෘත කිරීමෙන් වැළැකී සිටිය යුතුය යන්න ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය වාර්ෂික වාර්තා, 2020 Retrieved on 11th June, 2021, from https://www.macrotrends.net/countries/ LKA/sri-lanka/ crime-rate-statistics

Carter, M. A. (2013). Protecting Oneself from Cyber Bullying on Social Media Sites – a Study of Undergraduate Students. *Explore Scientific, Technical, and Medical Research on ScienceDirect*, *3*, 1235–1229. https://doi.org/10.1016/j.sb spro.2013. 10.020

Keipit, T., Markus, K., Atte, O., & Iina, S. (2017). Social Tie Strength and Online Victimization: An Analysis of Young People Aged 15–30 Years in Four Nations. *Soial Media + Society*, *3*(1). https://doi.org/10.1177/2056305117690013

Gatti, F., & Napoli, I. (2019). Families and Social Media Use: The Role of Par ents' Perceptions about Social Media Impact on Family Systems in the Relationship bet ween Family Collective Efficacy and Open Communication. International Journal of En vironmental Research and Public Health, 16(24), 5006. https://doi.org /10.3390 /ijerph 16245006